# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1916/9 - 2015 මැයි මස 27 වැනි බදාදා - 2015.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

1990 අංක 03 දරන බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 7 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාත් විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවහන, සමාජ සුහසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යවරයා විසින් සකස් කරන ලද රෙගුලාසි පහත දැක්වේ. මෙම රෙගුලාසි 2015.06.01 වැනි දින සිට බලපැවැත්වේ.

එච්. එම්. උපාලි කොඩිකාර,<br>
විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්,<br>
ජල සම්පාදන හා ජලාපවහන, සමාජ සුහසාධන සහ නාගරික<br>
හා වතු යටිතල පහසුකම් පිළිබඳ ගරු අමාත්‍ය,<br>
බස්නාහිර පළාත.

2015 මැයි මස 26 වැනි දින,<br>
බත්තරමුල්ලේ දී ය.

**1990 අංක 03 දරන බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රඥප්තිය යටතේ පළ කරනු ලබන රෙගුලාසි**

01. අංක 1552 - 2008 මැයි 30 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනයේ පළ කළ රෙගුලාසි මාලාවේ 5 'අ' (1) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත පරිදි සංශෝධනය කිරීම.

5 'අ' (1) අළුතින් නිවසක් ඉදිකිරීම

මේ සඳහා එක් ආධාරලාභියකුට ගෙවන උපරිම ආධාර මුදල රු.100,000/- කට සීමාවේ. ගෙවන වාරික ගණන 02 කි.

| | |
|---|---|
| (I) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට | රු. 60,000/- |
| (II) කොටසක් අවසන් කළ නිවසේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීමට | රු. 40,000/- |

1A - PG 2472 — 158 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. අංක 1345/16 - 2004 ජූනි 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* නිවේදනයේ පළකල රෙගුලාසි මාලාවේ 5 'අ' (2) උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත පරිදි සංශෝධනය කිරීම.

5 'අ' (2) - තිබෙන නිවස වැඩි දියුණු කිරීම සහ කොටසක් නිමකර ඇති නිවස සම්පූර්ණ කිරීම

මේ සඳහා එක් ආධාරලාභියකුට ගෙවන උපරිම මුදල රු. 50,000/- කට සීමාවේ. මුදල පහත පරිදි වාරික දෙකකින් ගෙවනු ලැබේ.

| | |
|---|---|
| (I) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට | රු. 30,000/- |
| (II) නියමිත වැඩ කොටස අඩක් නිමකළ විට | රු. 20,000/- |

03. අංක 1345/16 - 2004 ජූනි 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* නිවේදනයේ පළකල රෙගුලාසි මාලාවේ 5 'අ' (5) උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත පරිදි සංශෝධනය කිරීම.

5 'අ' (5) - වහලය සකස් කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම.

මේ සඳහා එක් ආධාරලාභියකුට ගෙවන උපරිම ආධාර මුදල රු. 30,000/- කට සීමාවේ. මුදල පහත පරිදි වාරික දෙකකින් ගෙවනු ලැබේ.

| | |
|---|---|
| (I) වැඩ ආරම්භ කිරීමට සූදානම් කළ විට | රු. 20,000/- |
| (II) නියමිත වැඩ කොටස අඩක් නිමකළ විට | රු. 10,000/- |

04. අංක 1345/16 - 2004 ජූනි 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* නිවේදනයේ පළකල රෙගුලාසි මාලාවේ 03 හි v (අ) උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත පරිදි සංශෝධනය කිරීම.

(අ) ආධාරලාභියා මසකට රු. 8,000/- ක නොඉක්මවන ආදායම්ලාභියකු විය යුතුය.

06 - 291

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.